# පරිසර සම්පත් පැතිකඩ

# 482 බී පනාගොඩ නගරය

බී.ඒ.පී.අප්සරා පද්මසිරි
2025.09.04

# 1. හැඳින්වීම

i. මූලික තොරතුරු

| | |
|---|---|
| a) වසම හා අංකය | පනාගොඩ නගරය 482 බී |
| b) වපසරිය | 1.044 වර්ගකිලෝමීටර් |
| c) ප්‍රා.ලේ. කොට්ඨාසය | හෝමාගම |
| d) ගොවිජන හා කෘෂිකර්ම කොට්ඨාසය | හෝමාගම , පනාගොඩ |
| e) සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කොට්ඨාසය | හෝමාගම |
| f) පශු වෛද්‍ය නිළධාරි කොට්ඨාසය | හෝමාගම |
| g) බීට්ටු වන කාර්යාල කොට්ඨාසය | කළුතර |
| h) අඩවි වන කාර්යාලය | වග |
| i) වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය | කොළඹ |

ii. ජනගහනය — 1638

ස්ත්‍රී - 824 } 2024 සම්පත් පැතිකඩින් තොරතුරු ලබා ගන්නා ලදී

පුරුෂ - 814

iii. ජනාවාසකරණයේ ස්වභාවය — අර්ධ නාගරික ග්‍රාමීය

iv. දේශගුණික තොරතුරු

a) අක්ෂාංශ හා දේශාංශගත පිහිටීම


| | |
|---|---|
| අක්ෂාංශ | 80.00 |
| දේශාංශ | 6.84 |

b) උෂ්ණත්වය

| | |
|---|---|
| සාමාන්‍ය | - 30.68 C |
| උපරිම | - 32 C |
| අවම | - 29.8 C |

c) වර්ෂාපතනය — 390mm

d) සාපේක්ෂ ආර්ද්‍රතාව — 32 %




(කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුවේ වෙබ් අඩවියෙන් උපුටා ගන්නා ලදී. )

v.පාංශු තොරතුරු

a) පසේ ස්භාවය — මැටි සහිත තෙත් පසක්
b) පසේ වර්ගය — රතු කහ පොට්සොලික්
c) සුලබ පාෂාණ ස්ථිත්වය — ග්‍රැනයිට්/ග්‍රැෆයිට්/සෙල්ස්පා ආදිය පනාගොඩ නගරය තුල නොමැති අතර කළු මිශ්‍ර පසක් දැකිය හැක.

2. පරිසර සම්පත් පැතිකඩක් පිළියෙල කිරීමේ අවශ්‍යතාව

I. තිරසර සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම.
II. පාරිසරික ගැටළු හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම.
III. සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම.
IV. පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය,සහභාගීත්වය හා අවබෝධය පුළුල් කිරීම.
V. සංවර්ධන යෝජනා හඳුනා ගැනීම හා පරිසර ශක්‍යතා සමගාමී කිරීම.
VI. අඛණ්ඩ මෙහෙයුම්කරණය , අධීක්ෂණය හා ඇගයීම ස්ථාපිත කිරීම.
VII. ආපදා අවදානම් හඳුනා ගැනීම හා බලපෑම් අවම කර ගැනීම.

3.ස්භාවික සම්පත් පැතිකඩ

1. භෞමික සම්පත්

a) වපසරිය/ භූමි ප්‍රමාණය

| | | |
|---|---|---|
| හෙක්ටයාර | - | 104.04 |
| අක්කර | - | |
| පර්චස් | - | |

b) භූමි පරිහරණ සැලසුම

- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි ප්‍රමාණය

I. වී - හෙක්ටයාර 47 ක පමණ ප්‍රමාණයක් මෙම වසම තුල වගා කර ඇත

II. වෙනත් ධාන්‍ය භෝග (ඉරිඟු/මුං/කව්පි) ආදිය - මෙම වසමට අදාළ නොවේ

III. අපනයන කෘෂි භෝග - ගම්මිරිස් ඉතා සුලු වශයෙන් වගා කර ඇත.

අක්කර 2.6

IV. භූමි යෙදවුම

1. ගොඩ ඉඩම් - 62.5

2. මඩ ඉඩම - 47.2

3. පුරන් වූ/අතහැර දැමූ - ඉතා සුලු ප්‍රමාණයක් ඇත

a. පසේ ස්වාභාවය හා සාඵල්‍යතා - පනාගොඩ නගරය වසමේ වගාවනට හිතකර ඉතා හොද සාරවත් පසක් පවති.

b. පාංශු ඛාදනයේ ස්වභාවය - මෙම වසමට අදාළ නොවේ

c. පාංශු හායනයේ ස්වභාවය - පනාගොඩ නගරය ග්‍රාම නිළධාරි වසම තුල මෙම තත්වය නොමැත.

II ජලජ සම්පත්

a) මතුපිට ජල මූලාශ්‍ර

- ගංගා - මෙම වසමට අදාළ නොවේ.
- අතු ගංගා/ඔය/දොළ - මෙම වසමට අදාළ නොවේ

ඇල මාර්ග - ඔලියල ඇළ, වැලිකුඹුරයාය පිට ඇළ, ගල්පොත්තයාය මහ ඇළ ගල්පොත්තයාය පිට ඇළ, දියපරගහයාය පිට ඇළ

- වැව්/තටාක - මෙම වසමට අදාළ නොවේ.
- පොකුණු/නිර්මිත පොකුණු(අත්හළ ගල්වල) - මෙම වසමට අදාළ නොවේ.
- දිය උල්පත් - මෙම වසමට අදාල නොවේ.

b) භූගත ජලය

- ළිං - 175
- නළ ළිං - 7

c) වර්ෂාපතනය

- වාර්ෂික මධ්‍යන්‍ය වර්ෂාපතනය(mm) - 280mm
- වර්ෂා ක්‍රමය (මෝසම්/ සංවහන) - මෙම වසම තුල සංවහන සහ නිරිතදිග මෝසම් දැකිය හැක.

d) වාරිමාර්ග කටයුතු

- මහා වාරි ව්‍යාපාර - හෙට්ටිගේ ඇළ
- සුළු වාරි ව්‍යාපාර - අදාළ නොමැත

e) ජලයේ ගුණාත්මකබව - PH අගය 6.5 , 7.5

ළිංවල PH අගය 7 ක් පමණ වේ.

f) ජල සුලභතාව -පනාගොඩ නගරය වසම තුල ජල අවශ්‍යතාවය සපුරා ගනු ලබන්නේ ජලසම්පාදන මණ්ලඩලය මගින් වන ජල ව්‍යාපෘති මගිනි. ළිං ජලය ඉතා සුලු පිරිසක් භාවිතා කරයි.දැඩි නියං කාල වලදී පමණක් ළිං ජලය අඩු වීමක් දක්නට ඇත.

Iii වනාන්තර හා වනවගාවන්

a) වන වැස්මේ වපසරිය(අක්කර හා හෙක්ටයාර් වලින්) - මෙම වසමට අදාළ නැත.

b) සුලභ ශාඛ පිළිබඳ ලේඛනය

- කොස් - 332
- කෙසෙල් - 553
- පොල් - 72
- අඹ - 58
- පේර - 36

c) දැවමය නොවන වන නිෂ්පාදන

- ආහාර හා ආකලන
  - ➢ ගම්මිරිස්
  - ➢ සේර
  - ➢ ඉගුරු
- දේශීය ඖෂධ
  - ➢ කහ
  - ➢ පාවට්ටා
  - ➢ හීන් බෝවිටියා
  - ➢ නිල් කටරොඩු
  - ➢ කෝමාරිකා

- ශාඛසාර (රෙසින්/තෙල්/ලාටු/මැලියම් ආදිය) - මෙම වසම තුල නැත.

- අත්කම් අමුද්‍රව්‍ය (වේවැල්/හණ/පට්ට ආදිය) - මෙම වසම තුල නැත.
- ඉදිකිරීම් අමුද්‍රව්‍ය - උණ, පොල්

- සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත ද්‍රව්‍ය - වසමට අදාළ නැත.

d) වන විනාශකිරීම් පිළිබඳ විස්තරය - වසමට අදාළ නැත.
e) වනවගා ව්‍යාපෘති විස්තරය - වසමට අදාළ නැත.
f) වන සංරක්ෂණ ප්‍රයත්නයන් - වසමට අදාළ නැත.
- ප්‍රජා වැඩසටහන්
- රාජ්‍ය / රාජ්‍යය නොවන/ස්වේච්ඡා සංවිධාන මගින්

Iv ජෛව විවිධත්වය.

a) ශාඛ ලේඛනය

| ශාඛ වර්ගය | ප්‍රමාණය |
|---|---|
| තේක්ක | 08 |
| කුඹුක් | 06 |
| බුරුත | 09 |

b) ශාඛ වර්ගීකරණය

| දේශීය | ඒක දේශීය | හඳුන්වාදුන් | ස්වාභාවික | ආගන්තුක | ආක්‍රමණශීලි |
|---|---|---|---|---|---|
| කොස් | රුක් අත්තන | රට ලේන්තැරි | උණ | | ගඳපාන |
| හල් | දෙල් | | | | |

4. පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

1. කෘෂිකර්මය

a) ප්‍රධාන භෝග (වී)

පනාගොඩ වසම තුළ හෙක්ටයාර් 45.5 භූමි වපසරියක් තුළ වී වගාව ව්‍යාප්තව ඇත.

b) අතිරේඛ භෝග (ධාන්‍ය හා ආහාර භෝග වර්ග)

කෙසෙල්

c) අපනයන භෝග (තේ/පොල්/රබර්)

පොල් අක්කර 2 ක් පමණ ව්‍යාප්තව ඇත.

d) සුළු අපනයන භෝග / අපනයන කෘෂි භෝග


වසමට අදාළ නැත

e) වෙනත් වාණිජ භෝග (පාම්/ ආගවුඩ් ආදිය)

වසමට අදාළ නැත

f) රසායනික පොහොර යෙදවුම

වී වගාව සඳහා පමණක් රසායනික පොහොර භාවිතා කරයි.පොල් වගාව සඳහා පොල් පොහොර ද භාවිතා කරයි.




g) කෘමි පළිබෝධනාශක යෙදවුම

h) සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්

මෙම වසම තුළ වී වගා කිරීමේදි සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් ලෙස,

- අතින් ගොයම් පැළ සිටුවීම.
- යායෙම ගොවීන් එක්ව ගොවිතැන් කටයුතු සිදු කිරීම.
- මී හරක් යොදාගෙන කුඹුරු සීසෑම.
- දෑ කැති භාවිතා කිරීම.
- කමතේදීම ගොයම් පෑගීම.

i) නවීන කෘෂිකාර්මික පිළිවෙත්

- බිම සැකසීම සඳහා අත් ට්‍රැක්ටරය සහ නවීන යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම.

j) යහපත් කෘෂි කාර්මික පිළිවෙත්

- 

k) කෘ ෂි කර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා (ස්වභාවික ආපදා/කෘමි හා පළිබෝධ බලපෑම්)

- වඳුරන්, රිලවුන් වැනි සතුන්ගෙන් සිදුකරනු ලබන අස්වනු හානි
- පොල් වගාවේදි රතු කුරුමිණියා මගින් සිදුකරන හානිය මෙන්ම කොල සුදුවීමේ රෝගයද සිදුවේ.
- පුහුණු මිනිස් ශ්‍රමයේ හිඟකම
- අතුරු භෝග වගාව සඳහා බෝවන දිලීර රෝග

Ii පශු සම්පත් කර්මාන්ත

a) **සුලභපශු කර්මාන්ත යෙදවුම් ( ගව/මීගව/එළු/ කුකුළු/වෙනත්)**

| අයිතිකරුගේ නම | කුකුලන් | එලුවන් | ආහාර සදහා | වෙලඳාම සදහා |
|---|---|---|---|---|
| නිලූෂා සුරංගි මිය | 42 | - | බිත්තර 35 | - |
| නිරාශා හිරිපිටිය | 15 | 02 | බිත්තර 12 | දිනකට - එලු කිරි ලීටර් 3 ක් පමණ අලෙවි කරයි |

b) **පශු කර්මාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබද විස්තරය( ස්වාභාවික/කෘතිම /මිශ්‍ර**

- ස්ඩ්ෆ්ග්ග්

c) **පශු වෛද්‍යමය සාධක (රෝග ආදිය)**

- 

Iii ධීවර කර්මාන්තය

a) ප්‍රධාන ධීවර ආයිතම ( මත්ස්‍ය වර්ග ) } අදාළ නොවේ.
b) ධීවර කාර්මික පරිවාර (සම්ප්‍රදායික බිලිබෑම)
c) ධීවර කර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා

Iv ශක්ති ප්‍රභව

a) ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය

- පුනර්ජනනීය ශක්ති ප්‍රභව

විදුලිය  ජනනය කරනු ලබන්නේ ඉන්ධන හා ගල් අඟුරු බලාගාර මගිනි. විදුලිය ඉතා ඉහල  පිරිවැයක් යොදා නිපදවිය යුත්තකි. විවිධ ක්‍රියාකාරකම් මත මූලා‍ය අර්බුද වලට මුහුණ දීමට රටක් වශයෙන් අපට සිදුවී ඇත.ඒ අනුව අනාගතයේදි සිදුවිය හැකි බලශක්ති අර්බුද වලට විසඳුම් අප විසින් ගවේෂණය කල යුතු වන්නෙමු

- පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව

මේ වන විට භාවිතා කරන පුනර්ජනනීය නොවන බලශක්ති ලෙස

- පෙට්‍ර්ල්
- භූමිතෙල්
- ගෑස්
- දර

හැදින්විය හැකිය...

b) ස්වභාවික ශක්ති සම්පත් කෙරෙහි වන ඉල්ලුම හා සැපයුම් අනුපාත විශ්ලේෂණය

මෙම ග්‍රාම නිළධාරි වසම තුල ප්‍රධාන වශයෙන් භාවිතා කරනු ලබන බලශක්ති ප්‍රභව ලෙස ඉන්ධන සහ විදුලිය හඳුනා ගත හැකියි.වරින් වර විදුලි බිල ඉහල යාම සහ ඉන්ධන මිල වෙනස්වීම දිළිදු ජනතාවට මුහුණදීමට සිදුවන ප්‍රබල ගැටලුවකි.මේ හේතු කරන කොට ගෙන මිනිසුන් පුනර්ජනනීය බලශක්ති වෙත යොමු වීමට කැමැත්ත ඇතත් , ඒ සඳහා මුහුණපෑමට සිදුවන ගැටලු වලට අපහසුතාවකින් තොරව මුහුණදීමට සිදු විය නොහැකි නිසා බයෝ ගෑස් නිපදවීමෙන්ද ඉවත්ව ඇත.

c) පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවේ දායකත්වය

5.සමාජ සංස්කෘතික සංදර්භය

i. පරිසර ගැටලු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණ යාන්ත්‍රණය

- කසළ කළමණාකරණය සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොමැති  වීම.
- ගෘහස්ත හා කර්මාන්ත අපද්‍රව්‍ය නිසිපරිදි වෙන් නොකිරීම.
- අවිධිමත් කසළ බැහැරකරණය
- වාසස්ථාන කැබලි කිරීම සහ විනාශ කිරීම නිසා ජෛව විවිධත්වය ගහනය පහල යාම.
- Clean Sri lanka වැඩසටහන යටතේ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවැත්වීම.
- පරිසර හිතකාමී කාබනික පොහොර භාවිතා කිරීමට පෙලඹවීම.
- පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් අඛණ්ඩව පැවැත්වීම.
- අපද්‍රව්‍ය පොදු ස්ථාන වලට හෝ වෙනත් අනවසර ස්ථානවලට බැහැර කිරීම වැළැක්වීම සඳහා නීති පද්ධතිය බලගැන්වීම
- නොදිරන අපද්‍රව්‍ය එකතු කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වයෙන් යුතු වැඩසටහන් මාලාවක් පැවැත්වීම.

ii. සාම්ප්‍රදායික පරිසර දැනුම හා පරිචාර

a) ජනප්‍රවාද

මෙම වසම තුල

b) ජනශෘතිය - වාර්තා වී නොමැත.

c) දේශීය වෛද්‍ය ක්‍රම - වාර්තා වී නොමැත.

iii.සාම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිවරණය - මේ වන විට වාර්තා වී නොමැත.

iv.පරිසර ගැටලු සඳහා යෙදුනු විසඳුම්/විකල්ප

ගැටලු :-

- ගෘහස්ථ හා ව්‍යාපාර ආයතන මගින් කසළ නිසි ලෙස බැහැර නොකිරීම
- වාහන වලින් සහ කර්මාන්ත වලින් පිටවන් අධික ශබ්දය
- කසළ ඒකරාශි වීම නිසා මැස්සන් , මදුරුවන් වැනි සතුන් බෝ වීම.
- ජෛව විවිධත්වය අහිමිවීම.

විසඳුම :-

- රසායනික පොහොර භාවිතය අවම කර වෙනත් විකල්ප භාවිතා වලට හුරුවීම.
- ස්වභාවික පොහොර හා කෘමි විකර්ශණ භාවිතා කිරීම.
- අවශ්‍යතා සීමිත වූ සරල ජීවන රටාවකට හිමිකම් කීම.
- හැකි සෑම අවස්ථාවකදීම පරිසරය සුරකීම සඳහා ක්‍රියා කිරීම.

6.කාලීන පාරසරික අර්බුද හා අභියෝග

i. වන විනාශය / කැළෑ එළිකිරීම - වාර්තා නොවේ.

ii. ජල හිගය - මෙතෙක් වාර් තා වී නොමැත

( ජල සම්පාදන මණ්ඩලය මගින් බොහෝ නිවාස වෙත මෙම ජල පහසුකම ලබාදී ඇත. )

iii. පාංශු හායනය - මෙතෙක් වාර්තා වී නොමැත.

iv.කැලිකසල බැහැර කිරීම - මෙම වසමේ නිවාස 513 ක් ඇත. ඔවුන් ග්‍රාමීය පරිසරයකට හිමිකම් කීවද මේවන විට සමාජයේ දියුණු වීමත් සමග ඉඩම් කැබලි කිරීම ආදි විවිධ හේතුන් මත සීඝ්‍රයෙන් ජනාකීර්ණ වීමක් මෙම වසම තුළ ද දැකිය හැක. කසළ බැහැර කිරීම යම් ප්‍රමාණයක් සිදු වන අතර, ඊට විසඳුමක් ලෙස කැලි කසළ ඉවත් කිරීම සඳහා කසල පොළක් පැවැත්වීම ප්‍රාදේශීය සභාව මගින් සිදුකරනු ලබයි.

v.දේශගුණික විපර්යාස වල බලපෑම - දේශගුණික විපර්යාස වලින් දැඩි බලපෑමක් සිදු නොවන අතර පරිභෝජනයට හා වගාකටයුතු වලට ප්‍රමාණවත් ජල පහසුකම වසම තුල සතුවේ. දැඩි සුළං කාල වලදී නිවාස දෙකකට පමණක් ඉතා සුලු හානි සිදුවිය.

vi.ආගන්තුක හා ආගන්තුක - ආක්‍රමණශීලී විශේෂවල බලපෑම - මෙම වසම තුල වාර්තා වී නොමැත.

7.පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපත කරගැනීම (ඇමුණුම 02)

I. පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව

මෙම වසමේ පිරිසිදු පානීය භූගත ජල පහසුකම මෙන්ම සෑම නිවසකම පාහේ ජල සම්පාදනය මගින් සපයා දී ඇති ජල පහසුකම භාවිතා කරයි. වසම තුළ ආරක්ෂිත ළිං 175ක්ද ඇත.

සනීපාරක්ෂක පහසුකම් පිළිබද සලකා බැලීමේදි සෑම නිවසකම පාහේ වැසිකිලි පහසුකම ඇති බව 2024 සම්පත් පැතිකඩ තොරතුරු ඒකරාශි කිරීමේදි පැහැදිලි විය.

II. ධරණීය හා සුනිත්‍ය බලශක්තිය

- තිරසර යටිතල පහසුකම් සහ සම්පත් බලශක්ති වැනි මූලික සේවා වෙත ප්‍රවේශ වීම ගුණාත්මක ජීවිතයකට හිමිකම්පෑමට හැකිවේ.
- 2030 වන විට පුනර්ජනනීය බලශක්ති මුලාශ්‍රයන්ගේ ඉහළ නැංවීම අරමුණු කර ගන්නා අතර මෙම වසමේද දැනටමත් පුනර්ජනනීය බලශක්ති ලෙස සෝලා පැනල් භාවිතා කිරීම නිවාස කිහිපයකම සිදුවේ.
- සෝලා පැනල් පිළිබද ප්‍රජාව තව තවත් දැනුවත් කිරීම සිදු කිරීම මෙහි තවත් අරමුණකි.
- සූර්ය කෝෂ වල ප්‍රමිතිය පිලිබද යෝජනා ප්‍රජාව වෙත බලගැන්වීම.

III. තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්

- චක්‍රිය ආර්ථිකය ක්‍රියාත්මක කිරීම තුළින් අමුද්‍රව්‍ය සදහා ඇති ඉල්ලුම අඩු කිරීම.
- සෙයිරි වැනි ඵලදායිතා සංකල්ප දියත් කිරීම.
- මෙම වසමේ සංවර්ධන අරමුණු වෙත ළගාවීම සදහා තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩ සැලැස්ම ක්‍රියාවට නැංවීම.
- අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාවට නැංවීම තුලින් ප්‍රජාවගේ සෞඛ්‍යට හා පරිසරයට සිදුවන්නාවූ අහිතකර බලපෑම් අඩුවේ.

IV. දේශගුණික විපර්යාස හා ඒවයේ බලපෑම්

මෙම තත්වය උදාවන්නේ මිනිස් ක්‍රියාකාරකම් නිසාය. දේශගුණික වෙනස්වීම් නිසා මෙම වසමටද කෘෂිකාර්මික කටයුතු වලදි අනපේක්ෂිත ලෙස වර්ෂාව වැනි දේශගුණික සාධක වලට මුහුණ පෑමට සිදුව ඇත. ඒ අනුව

- කාලගුණික සාධක
- ආහාර දාමය බිඳ වැටීම් ආදිය සිදුවේ.

V. සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම්දායක භාවිතාව

- වසමට අදාළ නොවේ.

VI. භෞම පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතාව

- වසමට අදාළ නොවේ.

8.තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමණාකරණ යාන්ත්‍රණයක් ස්තාපිත කිරීම සඳහා නව අදහස්,යෝජනා හා නිර්දේශ

- කෙටිකාලීන ,මධ්‍යකාලීන දිගුකාලීන ක්‍රම යෝජනා කිරීම
- නීතිය බලගැන්වීම
- කර්මාන්ත හිමියන්ට ස්වයං වගකීමක් සහ වගවීමක් තිබිය යුතුය.

9.ඇමුණුම්

I. සිතියම්
II. රූප සටහන් / කටු සටහන් / චිත්‍ර
III. ප්‍රජා සහභාගීත්ව පර්යේෂණ / සමීක්ෂණ

10.විමර්ශන

11.වසම පිළිබඳ